# "උපහාර" පාරිභෝගිකයන්ට "සෙනෙහසේ උපහාර" නමින් තවත් උපහාරයක්!

ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව, ජාතික ජංගම දුරකථන ජාලය වන ශ්‍රී ලංකා ටෙලිකොම් මොබිටෙල් සමඟ එක්ව, විප්ලවීය "උපහාර" පැකේජය ලබාගත් පාරිභෝගිකයන්ටත්, අලුතින් "උපහාර" පැකේජය ලබාගැනීමට බලාපොරොත්තු වන පාරිභෝගිකයන්ටත් "සෙනෙහසේ උපහාර" නමින් තම සමීපතමයන් 5 දෙනෙකුට ලබාදිය හැකි අතිරේක පැකේජයන් සහ සුවිශේෂ මිලකට අධිවේගී අන්තර්ජාල පැකේජයක් ලබාදෙන බවට නිවේදනය කර සිටී.

මෙම නව හඳුන්වාදීම හරහා "සෙනෙහසේ උපහාර" සම්බන්ධතා භාවිතා කරන කණ්ඩායමේ සාමාජිකයන් හට, එම කණ්ඩායම තුල ඉතා අඩු ඇමතුම් ගාස්තු හිමි වෙයි. මීට අමතරව අධිවේගී අන්තර්ජාල සම්බන්ධතාවයක්ද හිමි වනු ඇති අතර එම හඳුන්වාදීම අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් 2009 වසර ජාතික තොරතුරු තාක්ෂණය, සන්නිවේදනය සහ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ වසර ලෙස ප්‍රකාශ කිරීම හා එක්ව යමින් සිදුකරන ලද්දකි. මොබිටෙල්හි වෑයම වනුයේ රට පුරා විසිරුණු සියලුම "උපහාර" පාරිභෝගිකයන්ට අධිවේගී අන්තර්ජාල සේවාවක් භාවිතා කිරීමට අවස්ථාව ලබාදෙමින් ඔවුන්ව තොරතුරු සාක්ෂරතාවයෙන් සපිරි පුරවැසියන් (E-Citizens) බවට පත්කරවීමයි.

සාමයේ සහ සංවර්ධනයේ නව යුගය වන මේ අවධියේ ශ්‍රී ලංකාවේ සියළුම පළාත් වලට තම ආවරණය පුළුල් කිරීමට මොබිටෙල් බලාපොරොත්තු වන අතර මෙම "සෙනෙහසේ උපහාර" සම්බන්ධතා හරහා, රට පුරා විසිරී සිටින "උපහාර" පාරිභෝගිකයන් හට තම සමීපතමයන් සමඟ නිරතුරුව සම්බන්ධවී සිටීමට හැකිවනු ඇත.

පසුගිය වසරේ මෙම "උපහාර" පැකේජය හඳුන්වාදීමට මූලික වූ වෙළෙඳ, වාණිජ, අලෙවි ප්‍රවර්ධන, සමූපාකාර හා පාරිභෝගික කටයුතු ඇමති ගරු බන්දුල ගුණවර්ධන මහතා මේ නව හඳුන්වාදීම පිළිබඳව අදහස් දක්වමින් "මගේ බලාපොරොත්තුව සියළුම රජයේ සේවකයන් මෙම සෙනෙහසේ උපහාර සම්බන්ධතාවයන් තුළින් ලැබෙන ප්‍රතිලාභ වලින් සම්පූර්ණ ප්‍රයෝජනය ගනු ඇත යන්නයි." යනුවෙන්ද, "රාජ්‍ය ආයතන වශයෙන් රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවත් මොබිටෙල් ආයතනයත් නැවත වතාවක් එක්ව කටයුතු කරමින් රජයේ සේවකයන්ටත්, විශ්‍රාමිකයන්ටත්, පූජ්‍ය පක්ෂයටත් වාසි රැසක් ලබා දෙන මෙම පැකේජය නිර්මාණය කිරීමට කැපවීම මම අගය කොට සළකමි" යනුවෙන්ද පැවසීය.

ශ්‍රී ලංකා ටෙලිකොම් මොබිටෙල් හි සභාපතිනිය වන ලේෂා ද සිල්වා චන්ද්‍රසේන මහත්මිය මෙම නව "සෙනෙහසේ උපහාර" පැකේජය පිළිබඳව අදහස් දක්වමින් ප්‍රකාශ කළේ මොබිටෙල් ආයතනය, රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව හා එකතුව "උපහාර" පැකේජයේ සංකල්පය තවදුරටත් වර්ධනය කරමින් "උපහාර" පාරිභෝගිකයන්ට කෘතඥතාව දැක්වීමක් ලෙස "සෙනෙහසේ උපහාර" පැකේජය හඳුන්වාදුන් බවයි.

තව දුරටත් ඇය සඳහන් කළේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සංකල්පයක් පරිදි මෙම වසර තුල දිවයින පුරා තොරතුරු තාක්ෂණය, සන්නිවේදනය හා ඉංග්‍රීසි භාෂාව ව්‍යාප්ත කිරීම අරමුණු කරගනිමින් සියළුම "උපහාර" පාරිභෝගිකයන්ට සුවිශේෂ මිලක් යටතේ අන්තර්ජාල පැකේජයක් ලබාදීමට ද කටයුතු කර ඇති බවයි.

ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ සභාපති ප්‍රදීප් ගුණවර්ධන මහතා ප්‍රකාශ කළේ "ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ නිරන්තර උත්සාහය රාජ්‍ය අංශයේ සේවකයන්ගේ හා විශ්‍රාමිකයන්ගේ ජීවන මට්ටම් නගා සිටුවීමයි. මෙම පැකේජය හරහා ඔවුන්ට ඉතාම අඩු පිරිවැයක් යටතේ තම සමීපතමයන් සමඟ නිරන්තර සබඳතාවක් පවත්වා ගත හැකි වනු ඇති අතර මෙම අරමුණ සාක්ෂාත් කරගත හැකි වූයේ ජාතික ජංගම දුරකථන ජාලය වන මොබිටෙල් හා අත්වැල් බැඳගැනීම තුළිනි." යනුවෙනි.

පසුගිය 2008 වසරේ අගොස්තු මස, මහින්ද චින්තන රජයේ වැඩපිළිවෙල යටතේ හඳුන්වාදුන් විප්ලවීය "උපහාර" පසුගෙවුම් පැකේජය මත මෙම නව "සෙනෙහසේ උපහාර" පැකේජය නිර්මාණය වේ. "උපහාර"පැකේජයේ ප්‍රධාන අරමුණ වූ රටපුරා විසිරී සේවයේ නිරත වන රජයේ සේවකයන්ටත්, විශ්‍රාමිකයන්ගේත් මාසික වියදම අඩු කිරීම හා ජීවන තත්වය ඉහළ නැංවීමට මෙම නව "සෙනෙහසේ උපහාර" පැකේජය ඉවහල් වනු ඇත.

<u>සෙනෙහසේ උපහාර පැකේජය</u>

- මොබිටෙල් ජාලය තුල වීඩියෝ ඇමතුම් විනාඩි 50ක් නොමිලේ.
- "සෙනෙහසේ" කණ්ඩායම තුල ගන්නා ඇමතුම් ශත 50ක් සහ කෙටි පණිවුඩ ශත 25ක් තරම් අවම මිලකට.
- අනෙකුත් ඕනෑම මොබිටෙල් අංකයකට ගන්නා ඇමතුම් විනාඩියකට රු.1ක් සහ කෙටි පණිවුඩයක් ශත 75ක් වේ.
- අනෙක් දේශීය ජාලයන් වෙත ගන්නා ඇමතුම් විනාඩියකට රු. 3ක් සහ කෙටි පණිවුඩයක් රු. 1ක් වේ.
- එක සබඳතාවයකට මාසික ගාස්තුව රු. 50ක් වේ.
- මාසිකව 1GB දත්ත ප්‍රමාණයක් සමඟ 1Mbps අප්ලෝඩ්/ ඩවුන්ලෝඩ් වේගයක් ඇති 3.5G අන්තර්ජාල සබඳතාව මාසිකව රු.240ක ගාස්තුවක් යටතේ ලැබේ.

(සියළුම ගාස්තු රජයේ බදු හා ගාස්තු වලට යටත්ය)

TRC/M/09/003 (p)